3428

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

03 S

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2569 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2024 (2025)**

**(03) ශාසන ඉතිහාසය**

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**I කොටස**

1. (i) බුදුරජාණන් වහන්සේ තුළ පැවති මහාකරුණාව ප්‍රකට වන අවස්ථා දෙකක් සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි)

   (ii) පැවිද්දෙකු විසින් අත්හළ යුතු යැයි බුදුරදුන් පෙන්වා දුන් අන්ත දෙක කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

   (iii) එදිනෙදා ජීවිතයේ දී මැදුම් පිළිවෙත අනුගමනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

2. (i) සොළොස් මහාජනපද නම් කොට එයින් රාජාණ්ඩු ගණයට ඇතුළත් රාජ්‍ය හතරක් වෙන් කොට ලියා දක්වන්න. (ලකුණු 06 යි)

   (ii) බුද්ධකාලයේ ශාසන අභිවෘද්ධිය සඳහා මගධ හා කෝසල යන රාජ්‍ය දෙකෙන් ලැබුණු සහාය කෙබඳු දැයි විස්තර කරන්න. (ලකුණු 06 යි)

   (iii) බුදුරජාණන් වහන්සේගේ සමානාත්මතා ධර්මය නිසා කුලවාදයෙන් පීඩාවට පත්වූවන්ගේ හා කාන්තාවන්ගේ විමුක්තිය සැලසුණු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

3. (i) බුද්ධකාලයේ සිට ම ධර්ම විනය සම්බන්ධයෙන් විවිධ මත දැරූ පිරිස් භික්ෂු සමාජය තුළ සිටි බවට කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 06 යි)

   (ii) සාමණේර පැවිද්ද හා උපසම්පදාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

   (iii) විනය නීති පැනවීමේ දී බුදුරජාණන් වහන්සේ ප්‍රජාතාන්ත්‍රික ක්‍රමයක් අනුගමනය කළ බව නිදසුන් මගින් තහවුරු කරන්න. (ලකුණු 08 යි)

4. (i) ප්‍රථම ධර්ම සංගායනාව පිළිබඳ ප්‍රමාණවත් සටහනක් සම්පාදනය කරන්න. (ලකුණු 06 යි)

   (ii) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා බල පෑ හේතු ලියා දක්වන්න. (ලකුණු 06 යි)

   (iii) බුදු සසුනේ ව්‍යාප්තිය උදෙසා ප්‍රථම හා දෙවන ධර්ම සංගායනා ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

5. (i) අශෝක රජුගේ ළමා විය සහ රාජ්‍යත්වයට පත්වීම පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

   (ii) "බුදුසමයේ එන ඉගැන්වීම් පදනම් කොටගෙන අශෝක රජතුමා ශිෂ්ට සමාජයක් ගොඩනැගීමට සමත් විය." පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

   (iii) බුදුදහමේ ව්‍යාප්තියට අශෝක රජතුමාගෙන් ලැබුණු අනුග්‍රහය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

## II කොටස

6. (i) "මහින්දාගමනයට පෙර සිට ම ලක්වැසියෝ බුදුදහම පිළිබඳ ව දැන සිටියහ." මේ ප්‍රකාශය සාධක තුනක් ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 06

(ii) මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජතුමාගේ බුද්ධිය හා ධර්මාවබෝධ ශක්තිය පරීක්ෂා කළ ආකාරය ගෙනහැර දක්වන්න. (ලකුණු 06

(iii) මිහිඳු මහරහතන් වහන්සේ දෙවනපෑතිස් රජු ඇතුළු පිරිසට දේශනා කළ සූත්‍ර ධර්ම හතරක් නම් කොට ඒවායේ අන්තර්ගතය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 08

7. (i) බෝධි වෘක්ෂය අතීතයේ පටන් ම භාරතීය ජනයාගේ පූජනීයත්වයට ලක්ව පැවති බවට සාධක ඉදිරිපත් කරන්න. (ලකුණු 06

(ii) ශ්‍රී මහාබෝධීන් වහන්සේ මුල් කොටගෙන සිංහල සාහිත්‍යයට එක්වූ කෘති තුනක් එහි කතුවරු සමග ලියා දක්වන්න. (ලකුණු 06

(iii) දුමින්දාගමනයෙන් ලක්දිව සිදු වූ සංස්කෘතික ප්‍රබෝධය ඇගයීමට ලක්කරන්න. (ලකුණු 08

8. (i) සංඝමිත්තා තෙරණිය වෙතින් පැවිදි උපසම්පදාව ලැබූ භික්ෂුණීන් වහන්සේලා හය දෙනකු නම් කරන්න. (ලකුණු 06

(ii) ලක්දිව මෙහෙණි සසුනේ වර්ධනය සිදු වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 06

(iii) ලාංකේය භික්ෂුණී ශාසනයට අනුග්‍රහ දැක්වූ රජවරු හතර දෙනකු නම් කොට ඔවුන්ගෙන් සිදු වූ මෙහෙය කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 08

9. (i) දළදා වහන්සේ පිළිබඳ තොරතුරු ඇතුළත් මූලාශ්‍රය තුනක් නම් කරන්න. (ලකුණු 06

(ii) "දළදා වහන්සේ අප සතු ජාතික පූජනීය වස්තුවකි." මේ ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 06

(iii) දළදා පෙරහැරේ පවත්නා ආගමික හා සංස්කෘතික වටිනාකම ගෙනහැර දක්වන්න. (ලකුණු 08

10. පහත සඳහන් මාතෘකා අතුරෙන් හතරක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) කෝසල ජනපදය
(ii) සංඝමිත්තා තෙරණිය
(iii) මහනුවර දළදා මාළිගාව
(iv) කණිෂ්ක රජතුමා
(v) රුවන්වැලි දාගැබ
(vi) වස් විසීම
(vii) දාග වස්තුව
(viii) අශෝක ධර්ම ලිපි

PAST PAPERS WIKI

(ලකුණු 05 × 4 = 20

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

* * *